**සීඒ/6/1/2/5** **2024.07.25**

චක්‍රලේඛ අංකය - සං.ප්‍ර.2024/01

සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත

**<u>අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා නර්තන/ සංගීත/ චිත්‍ර/ තරගාවලිය - 2024</u>**
**<u>නර්තන තරඟාවලිය (සිංහල අංශය)</u>**

**<u>හැඳින්වීම</u>**

දැයේ දූ දරුවන් සෞන්දර්යය අධ්‍යාපනයට නැඹුරු කරමින් ඔවුන්ගේ කලා කුසලතා වර්ධනය කරවීම මඟින් සංවේදී සුචරිතවත් අනාගත පරපුරක් බිහි කරලීමේ අරමුණෙන් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගෙන පවත්වන සුවිශේෂී වැඩසටහනකි.

01. **<u>අරමුණ</u>**

i. සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කර ඉදිරි අනාගතයට පවරා දීම.
ii. නර්තන ක්ෂේත්‍රයෙහි නව නිර්මාණකරණය සඳහා අවස්ථාව ලබා දෙමින් දිරි ගැන්වීම.
iii. සංස්කෘතික මධ්‍යස්ථාන ආශ්‍රිත කලාකාමීන්ගේ කුසලතා සහ සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රාදේශීය විශේෂතා ජාතික තලයට ගෙන ඒමට අවකාශ සැලසීම.
iv. සංස්කෘතික ක්‍රියාකාරකම් කෙරෙහි පුරවැසියන්ගේ දායකත්වය වර්ධනය කිරීම මගින් සමාජයෙහි මානවීය ගුණාංග ප්‍රතිෂ්ඨාපනය කිරීමට දායකත්වය දැක්වීම.
v. නර්තන කලාව ප්‍රවර්ධනයෙන් සමාජයෙහි රසඥතාවය වර්ධනය කිරීමටත්, ජය පරාජය උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමටත්, ඒ ඇසුරින් ජීවිතාභිවෘද්ධිය සලසා ගැනීමටත් මග පාදා දීම.

02. **<u>පොදු උපදෙස්</u>**

i. ඉදිරිපත් වන සෑම තරඟකරුවෙක් ම තරඟ පවත්වන දිනය වන විට සංස්කෘතික මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී අවම වශයෙන් මාස හතරක් ඉක්මවා තිබිය යුතු ය. ( E කාණ්ඩයේ - ජ්‍යෙෂ්ඨ පුරවැසි අංශය සඳහා මෙය වලංගු නොවේ.)
ii. තරඟ පැවැත්වෙන දිනයන් ආසන්නයේ දී වෙනත් ආයතනයක සිසුන් ලියාපදිංචි කර තරඟ සඳහා ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන් තහනම් ය.
iii. තරඟවලට සහභාගී වීමේ දී මධ්‍යස්ථානවල ලියාපදිංචි වී නොමැති සිසුන් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් එම ඉදිරිපත් කිරීම අවලංගු කරනු ලබන අතර ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් මධ්‍යස්ථාන නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත. ඒ අනුව කිසියම් තරඟ ශීර්ෂයක් අවලංගු කරනු ලැබූ මධ්‍යස්ථාන සඳහා ශූරතාව හෝ අනුශූරතාව අහිමි වනු ඇත.
iv. පළාත් මට්ටමේ හා ජාතික මට්ටමින් අදියර දෙකක් යටතේ තරඟාවලිය පවත්වන අතර පළාත් තරඟයේ දී ලකුණු 50 හෝ 50ට වැඩි පළමු ස්ථාන ලබා ගන්නා තරඟ ශීර්ෂ පමණක් ජාතික තරඟය සඳහා සුදුසු කම් ලබනු ඇත. පළාත් සහ ජාතික තරඟය පැවැත්වෙන ස්ථානය හා දිනය පසුව දන්වනු ලැබේ.
v. පළාත් වටයෙහි තරඟ අංශයන් සඳහා සහභාගී වී ජයග්‍රහණය කරනු ලබන කණ්ඩායම්වල සාමාජික සිසුන් පමණක් ජාතික වටයේ තරඟ සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර ජාතික තරඟය සඳහා වෙනත් සිසුන් කණ්ඩායම්වලට ඇතුලත් කිරීම තරඟයෙන් ඉවත් කිරීමට හේතු වේ.
vi. තරඟ විනිශ්චය සඳහා චක්‍රලේඛය සමඟ යාකොට ඇති ලකුණු ලබාදීමේ පටිපාටිය උපයෝගී කරගනු ඇත. කිසිදු තරඟ ශීර්ෂයක් සඳහා සම ස්ථාන ලබා දෙනු නොලැබේ.

vii. පළාත් තරගය පැවැත්වෙන දිනය වන විට යොමු කරන ලද නාමලේඛනයෙහි නම් වෙනස් වන්නේ නම් ඒ බව පිළිගත හැකි හේතු සමග විෂයය භාර අතිරේක ලේකම් හෝ එම අංශයෙහි මාණ්ඩලික නිලධාරියකු දැනුවත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

viii. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

ix. කිසිදු තරඟයකට ඉදිරිපත් නොවූ සංස්කෘතික මධ්‍යස්ථානවල සම්පත්දායක දීමනා නවතා දැමීමට කටයුතු කරනු ඇත.

x. ජාතික හැඳුනුම්පත/ තැපැල් හැඳුනුම්පත/ උප්පැන්න සහතිකයෙහි ඡායාපිටපතක් සමඟ වසරක් ඇතුළත ලබා ගත් ඡායාරූපය ස්ථානභාර සංවර්ධන ප්‍රවර්ධන නිලදාරී විසින් තම අත්සන සහ නිල මුද්‍රාව සහිතව සහතික කර ඉදිරිපත් කල යුතු ය.

xi. ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 2024.08.09 වේ. එදිනට පෙර ඉල්ලුම් පත්‍රය සාමාන්‍ය තැපැල / ලියාපදිංචි තැපැල හෝ අතින් ගෙනවිත් ප්‍රවර්ධන අංශයට භාර දිය යුතුය.

xii. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

xiii. තරඟයේ ප්‍රතිඵල නිකුත් කළ පසු විනිශ්චය මණ්ඩලය සමඟ පසු විපරම් කිරීම, විවේචනය, සමාජ මාධ්‍ය හරහා මත පල කිරීම සපුරා තහනම් වන අතර එසේ සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගනු ලැබේ.

xiv. චක්‍රලේඛය සම්බන්ධයෙන්/ තරඟාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇති වුවහොත් ඒ පිළිබඳව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ බලය පැවරූ අතිරේක ලේකම්ගේ (ප්‍රවර්ධන) තීරණය අවසන් තීරණය වේ. එම තීරණ අභියෝගයට ලක් කළ නොහැකි ය.

## 03. තරඟ කොන්දේසි.

i. සමස්ත තරඟාවලියෙහි වයස් සීමාවන් පහත පරිදි වන අතර ඒ අනුව තරඟ තෝරා ගත යුතු ය.

| අක්ෂරය | අංශය | වයස් සීමාව |
|---|---|---|
| A | ප්‍රාථමික - සමූහ | අවු. 11ට අඩු (උපන් දිනය 2013.07.01 දින හෝ ඊට පසු යෙදී තිබිය යුතුය.) |
| B | කණිෂ්ඨ - සමූහ | අවු. 11-15 අතර<br>(වයස අවු.14 අවසන් වී අවු.15 ආරම්භ වන තෙක් - උපන් දිනය 2009.06.30 සිට 2013.06.30 දක්වා (දෙදිනද ඇතුළත්ව) යෙදී තිබිය යුතුය.) |
| C | ජ්‍යෙෂ්ඨ - සමූහ | අවු. 15 – 20 අතර<br>(වයස අවු.15න් ආරම්භ වී අවු.20 ආරම්භ වන තෙක් - උපන් දිනය 2004.06.30 සිට 2009.06.29 දක්වා (දෙදිනද ඇතුළත්ව) යෙදී තිබිය යුතුය.) |
| D | විවෘත - සමූහ | අවු.20න් ඉහළ (උපන් දිනය 1974.06.30 සිට 2004.06.29 දක්වා (දෙදිනද ඇතුළත්ව) යෙදී තිබිය යුතුය.) |
| E | ජ්‍යෙෂ්ඨ පුරවැසි | අවු.50න් ඉහළ (උපන් දිනය 1974.06.29 දින හෝ ඊට පෙර යෙදී තිබිය යුතුය.) |
| F | ජ්‍යෙෂ්ඨ - ඒකල | අවු. 15 – 20 අතර<br>(වයස අවු.15න් ආරම්භ වී අවු.20 ආරම්භ වන තෙක්) |

ඉහත වගුවෙහි A,B,C,D කාණ්ඩවලින් උපරිමය 01 බැගින් ද, F කාණ්ඩයේ උපරිමය 01ක් ද, E කාණ්ඩයේ උපරිමය 01ක් ද, බැගින් එක් මධ්‍යස්ථානයක් සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව අංග 06කි.

ii. තරඟ සඳහා වයස් සීමාවන් ගණනය කිරීම 2024.06.30 දිනට සැලකිය යුතු ය.

iii. එක් ශිෂ්‍යයෙකුට සහභාගී විය හැක්කේ තරඟ ශීර්ෂ එකකට පමණි.

iv. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තරග ශිර්ෂ සඳහා වෙන වෙනම අයදුම් කිරීමට කටයුතු කරන්න.

v. අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශිෂ්‍ය අනන්‍යතාවය පැහැදිලි කර ගැනීම සඳහා ලියාපදිංචි ලේඛනය ඉදිරිපත් කළ යුතු ය.

vi. අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි තරඟකරුවන් සිටියහොත් ජයග්‍රහණය කළ ද අවලංගු කරනු ලැබේ.

vii. පළාත් වටයෙන් ජාතික වටයට සුදුසුකම් ලබන්නේ ලකුණු 50හෝ 50ට වැඩි ලකුණු ලබා ගත් පළමු ස්ථානය පමණි. ජාතික හා පළාත් වටයේ සහතික පත්‍ර පිරිනැමීම ලකුණු 50 ක් ලබාගත් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන සඳහා පමණි. ජාතික තරඟාවලියේදී ලකුණු 80 ට වැඩියෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා තරඟ අංශය සඳහා පමණක් සම්මානයක් හිමි වේ.

viii. පළාත් තරඟ වටයේදී පුහුණු ඇඳුම් කට්ටලයෙන් මීට සහභාගී විය යුතු අතර ජාතික තරඟ වටයේ දී සුදුසු නර්තන ඇඳුම් කට්ටලයකින් සැරසී ඉදිරිපත් විය යුතු ය.

ix. තරඟ නීතිරීති උල්ලංඝනය වන අවස්ථාවල දී විධිමත් පරීක්ෂණයකින් පසුව අදාළ තරඟ ප්‍රතිඵල අත්හිටුවීමට, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රතිඵල ලේඛනවලින් ඉවත් කිරීම හෝ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත විෂයය භාර මාණ්ඩලික නිලධාරීන්ට සිදු කළ හැකිය.

x. සමූහ තරඟ සඳහා නර්තනයෙන් උපරිමය 16ක් ද, අවමය 06ක් ද, වාදනය සහ ගායනය සමඟ 09ක් ද වශයෙන් ශිල්පීන්ට සහභාගී විය හැකි ය. උපරිමය 25කි.

xi. පසුබිම් සංගීතය සජීවී ව සිදු කළ යුතු ය.

xii. ගායනය සඳහා අදාල වයස් කාණ්ඩයේ ම සිසු සිසුවියන් සහභාගී විය යුතු ය.

xiii. වාදනය සඳහා අදාළ සංස්කෘතික මධ්‍යස්ථානයේ සම්පත්දායකයෙකු හෝ එම මධ්‍යස්ථානයේ ලියාපදිංචි ඕනෑ ම සාමාජිකයෙකු හෝ සහභාගී වීම අනිවාර්ය වේ.

xiv. විද්‍යුත් සංගීත භාණ්ඩ භාවිතයේ දී විදුලිය විසන්ධිවීමක් සිදු වුවහොත් ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ගයන් තරඟකරුවන් විසින් ම සම්පාදනය කර ගත යුතු ය.

xv. සමස්ත තරඟාවලියේ ම ලබා ගන්නා ස්ථානයන් පාදක කර ගනිමින් ලබා දෙන ලකුණු අනුව වැඩි ම ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා ශූරතාවය ද දෙවන මට්ටමේ ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා අනුශූරතාවය ද හිමි වේ.

**එක් එක් තරඟ ශිර්ෂ හා ඊට අදාළ කොන්දේසි**

**(A) <u>ප්‍රාථමික - සමූහ - මිශ්‍ර (අවු. 11ට අඩු)</u>**

**01. වැස්ස හා ළමා ලෝකය**

උපදෙස් -

- මෙම වයස් කාණ්ඩයට අදාළ වන පරිදි උචිත චලන සහ සංකල්ප තෝරා ගත යුතු ය.
- මේ සඳහා අවශ්‍ය පද රචනා හා තනු නිර්මාණ යොදා ගන්නේ නම් ස්වාධීන නිර්මාණ විය යුතු ය.
- පසුබිම් සංගීතය සජීවී ව සිදු කළ යුතු ය.
- කාලය උපරිමය වි. 04කි.

- රංග භාණ්ඩ භාවිත කළ හැකි ය.
- පසුතල නිර්මාණ භාවිත නොකළ යුතු ය.
- ඕනෑ ම වාද්‍ය භාණ්ඩයක් භාවිත කළ හැකි ය. (විද්‍යුත් භාණ්ඩ)

(B) **<u>කණිෂ්ඨ - සමූහ - මිශ්‍ර (අවු. 11-15 අතර )</u>**

**02. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායයන්හි ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පදවල පළමු සරඹ 03 සහ ඊට අදාළ කස්තිරම්, ඉරට්ටි, කලාසම් ඇසුරින් නර්තන නිර්මාණයක්**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- මෙම තරග ඉසව්ව සඳහා ගැහැණු පිරිමි දෙපාර්ශවය ම නියෝජනය අනිවාර්ය විය යුතු අතර
  අනුපාත නොසැළකේ.
- නර්තනය ඉදිරිපත් කිරීමේ දී පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත කළ නොහැක.
- .උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායයන්හි වාද්‍ය භාණ්ඩයන්ට අමතරව පසුබිම් වාදනය සඳහා ඕනෑම දේශීය අවනද්ධ භාණ්ඩයක් භාවිතා කළ හැකි ය.
- අවශ්‍ය නම් සුදුසු පරිදි සාම්ප්‍රදායික හෝ නිර්මාණාත්මක ගායනයක් යොදා ගත හැකි ය.
- සහය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය

(C) **<u>ජ්‍යෙෂ්ඨ - සමූහ (අවු. 15 – 20 අතර)</u>**

**03. උඩරට - ගැහැණු - සමූහ - කුවේණි අස්න**
**04. උඩරට - පිරිමි - සමූහ - යක් ඇනුම**
**05. උඩරට - මිශ්‍ර - සමූහ - යක්තුන් පදය**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- මිශ්‍ර තරග ඉසව් සඳහා ගැහැණු පිරිමි දෙපාර්ශවය ම නියෝජනය අනිවාර්ය විය යුතු අතර අනුපාත නොසැළකේ.
- නර්තනය ඉදිරිපත් කිරීමේ දී පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත කළ නොහැක.
- සහය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.

**06. පහතරට - ගැහැණු - සමූහ - ශුද්ධ මාත්‍රා**
**07. පහතරට - පිරිමි - සමූහ - විෂ්ණු මල් අස්න**
**08. පහතරට - මිශ්‍ර - සමූහ - නාග රාක්ෂ හා නාග කන්‍යා සම්මිශ්‍රණයක් කළ නර්තන අංගයක්**

උපදෙස් -

- සාම්ප්‍රදායික නාගරාක්ෂ හා නාගකන්‍යා කෝලම් සම්මිශ්‍රණයෙන් නිර්මාණය කොට ගත් නර්තන අංගයක් ඉදිරිපත් කළ යුතු ය.
- කාලය උපරිමය වි. 05කි.
- දී ඇති කාලයට අමතර සමා කාලය තත්පර 30කි.

- මෙම තරග ඉසව්ව සඳහා ගැහැණු පිරිමි දෙපාර්ශවය ම නියෝජනය අනිවාර්ය විය යුතු අතර
  අනුපාත නොසැළකේ.
- පළාත් වටයේ දී සහ අවසාන වටයේ දී අදාළ සාම්ප්‍රදායික ලී වෙස් මුහුණු පමණක් භාවිත කළ යුතු ය.
- සහය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.

**09. සබරගමු - ගැහැණු - සමූහ - සිංදු මාත්‍රය**
**10. සබරගමු - පිරිමි - සමූහ - මල් පදය**
**11. සබරගමු - මිශ්‍ර - සමූහ - යහන් දැක්ම**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- මෙම තරඟ ඉසව්ව සඳහා ගැහැණු පිරිමි දෙපාර්ශවය ම නියෝජනය අනිවාර්ය විය යුතු අතර
  අනුපාත නොසැළකේ.
- සහය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.

**12. වාදන - මිශ්‍ර- සමූහ - දේශීය පංචතූර්ය වාද්‍ය භාණ්ඩ ඇසුරින් කරන ලද ප්‍රාසාංගික නිර්මාණයක්**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- හඬ පාලනය, පද වාදනය, ශිල්පීය නිපුණතා, ප්‍රාසාංගික බව, සාමූහික බව, වාදනයෙහි සමස්ත හඬ සුසංයෝගය ආදිය පිළිබඳ ව සළකා බැලේ.
- සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිමය 16කි. අවමය 06කි.
- කවි ගායනා ඉදිරිපත් නොකළ යුතු ය.

## <u>(D)විවෘත - සමූහ - මිශ්‍ර (අවු.20න් ඉහළ)</u>

**13. දේශීය හා විදේශීය සාම්ප්‍රදායික නර්තන ඇසුරු කොටගෙන නර්තන ප්‍රතිභාව ප්‍රකට වන ලෙස ගොඩ නගා ගත් නිර්මාණාත්මක නර්තනයක්**

උපදෙස් -

- නර්තන, ගායන, වාදන ඇතුලුව සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 18කි. අවමය 06කි.
- කාලය උපරිමය වි. 05කි.
- අවශ්‍යතාව පරිදි රංග භාණ්ඩ භාවිත කළ හැකි ය.
- පසුතල නිර්මාණ අවශ්‍ය නොවේ.
- මිශ්‍ර තරඟ ශීර්ෂයකි. අනුපාත නොසැළකේ.
- මෙම තරඟ ශීර්ෂයේ දී ගායන, වාදන ශිල්පීන් සියලු දෙනාට රංග භූමිය මත ප්‍රාසාංගික අංගයෙහි සාමාජිකයින් ලෙසට ද සහභාගි විය හැකි ය.

**<u>( E )ජ්‍යෙෂ්ඨ පුරවැසි - සමූහ - මිශ්‍ර (අවු.50න් ඉහළ)</u>**

**14. සොකරි නාටකය/ කෝලම් නාටකය/ ශාන්ති කර්මවල නාට්‍යමය පෙළපාලි අතුරින් ඉදිරිපත් කිරීමක්.**

උපදෙස් -

- ඉහත ඕනෑම සාම්ප්‍රදායික නාටකයක හෝ ඕනෑම ශාන්ති කර්මයක නාට්‍යමය පෙළපාලියක් තෝරා ගත හැකි ය.
- නර්තන, ගායන, වාදන ඇතුලු ව සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 12කි. අවමය 04කි.
- කාලය උපරිමය වි. 10කි.
- අවශ්‍යතාව පරිදි රංග භාණ්ඩ භාවිත කළ හැකි ය.
- පසුතල නිර්මාණ අවශ්‍ය නොවේ.
- ගැහැණු පිරිමි මිශ්‍ර වශයෙන් ඇගයීමට ලක් නොකෙරේ.
- මෙම තරඟ ශිර්ෂයේ දී සහභාගී වන ගායන, වාදන, නර්තන ශිල්පීන් සියලු දෙනා රංග භූමිය මත දර්ශනය වන පරිදි අංගය ඉදිරිපත් කළ යුතු ය.
- ජාතික තරඟාවලියේ දී නිසි ඇඳුම් පැළඳුම් සහ වෙස් ගැන්වීම් භාවිතා කළ යුතු ය.
- සංස්කෘතික මධ්‍යස්ථානයේ බල මණ්ඩලය ආශ්‍රිත පිරිස් සඳහා අවස්ථාව ලබා දේ.

**<u>(F) ජ්‍යෙෂ්ඨ - ඒකල - (අවු. 15 – 20 අතර)</u>**

**15. උඩරට - ගැහැණු - ඒකල - ඉරුගල් බණ්ඩාර දෙවියන්ගේ කෝල්මුර**
**16. උඩරට - පිරිමි - ඒකල - වීරමුණ්ඩ දෙවියන්ගේ කෝල්මුර**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- නර්තනය ඉදිරිපත් කිරීමේ දී පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත කළ නොහැක.
- සහාය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.
- නර්තන ශිල්පියා හෝ ශිල්පිනිය ඇතුලුව සහය ගායන, වාදන ශිල්පීන් උපරිමය 05කි.

**17. පහතරට - ගැහැණු - ඒකල - පත්තිනි මල් අස්න**
**18. පහතරට - පිරිමි - ඒකල - කතරගම මල් අස්න**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- නර්තනය ඉදිරිපත් කිරීමේ දී පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත කළ නොහැක.
- සහාය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.
- නර්තන ශිල්පියා හෝ ශිල්පිනිය ඇතුලුව සහය ගායන, වාදන ශිල්පීන් උපරිමය 05කි.

**19. සබරගමු - ගැහැණු - ඒකල - සමන් දෙවි මල් අස්න**

**20. සබරගමු - පිරිමි - ඒකල - දලුමුර උපත**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- නර්තනය ඉදිරිපත් කිරීමේ දී පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත කළ නොහැක.
- සහාය වාදන, ගායන ශිල්පීන් රංග භූමියට නොපැමිණිය යුතු ය.
- නර්තන ශිල්පියා හෝ ශිල්පිනිය ඇතුලුව සහාය ගායන, වාදන ශිල්පීන් උපරිමය 05කි.

**21. වාදන- ගැහැණු - ඒකල - ගායනය සමඟ වාදනයක්**

උපදෙස් -

- කාලය උපරිමය වි. 04කි.
- දෙතිතේ තිත් රූප 02කට වාදනය කළ හැකි ය.
- කස්තිරම්, ඉරට්ටි, කලාසම් භාවිත කළ හැකි ය.
- ගැට බෙර, පහතරට බෙර, දවුල, තම්මැට්ටම භාවිත කළ හැකි ය.
- තාලය පවත්වාගෙන යැමට සහාය ශිල්පියෙක් යොදා ගත හැකි වන අතර ඇයට වාදනය කළ හැක්කේ තාලම්පට වන අතර සහාය වාදන ශිල්පිනියට ගායනය කළ නොහැකි ය.
- වාදන ශිල්පිනිය ඇතුලුව සහාය වාදන ශිල්පිනියන් උපරිමය 05කි.

**22. වාදන- පිරිමි - ඒකල - දක්ෂතම වාදන ශිල්පියා**

උපදෙස් -

- කාලය උපරිමය වි. 05කි.
- දෙතිතේ තිත් රූප 02කට වාදනය කළ හැකි ය..
- ගැට බෙර, පහතරට බෙර, දවුල, දඬුබෙරය සම්බන්ධ කළ තම්මැට්ටම් ප්‍රමුඛව වෙනත් ඕනෑම ස්වර හෝ අවනද්ධ භාණ්ඩ 02ක් භාවිත කළ හැකි ය.
- තාලය පවත්වාගෙන යැමට සහාය ශිල්පියෙක් යොදා ගත හැකි වන අතර ඔහුට වාදනය කළ හැක්කේ තාලම්පට පමණි.
- වාදන ශිල්පියා ඇතුලුව සහාය වාදන ශිල්පීන් උපරිමය 05කි.

## <u>අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන පළාත්/ජාතික නර්තන තරගාවලිය - 2024</u>
## <u>ලකුණු දීමේ නිර්ණායක</u>

**01. ප්‍රාථමික - සමූහ මිශ්‍ර - වැස්ස**

| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | තේමාව ඉස්මතු වන පරිදි ගායනය සඳහා පද නිර්මාණය | 15 | 10 |
| 2 | ඉහත අවධියේ දරුවන්ට ගැලපෙන උචිත චලන භාවිතය හා නිර්මාණය | 15 | 15 |
| 3 | අවකාශ භාවිතය හා රංග වින්‍යාසය | 20 | 20 |
| 4 | නර්තන කුසලතා සහ අදහස් ප්‍රකාශනය | 20 | 20 |

| | | | |
|---|---|---|---|
| 5 | නිර්මාණය සඳහා සහභාගී වන සමස්ත ශිල්පීන්ගේ දායකත්වය (සාමූහික බව) | 25 | 20 |
| 6 | රංග භාණ්ඩ භාවිතය | 05 | 05 |
| 7 | උචිත රංග වස්ත්‍රාභරණ | - | 10 |
| | **එකතුව** | **100** | **100** |

**02.ශාස්ත්‍රීය නර්තන - කණිෂ්ඨ /ජ්‍යෙෂ්ඨ සමූහ**
**(උඩරට/පහතරට/සබරගමු)**

| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | සාම්ප්‍රදායික බව සුරැකීම | 20 | 20 |
| 2 | වාදන, තාල, ලය නිවැරදි බව | 15 | 15 |
| 3 | අවකාශ භාවිතය හා රංග වින්‍යාසය | 15 | 15 |
| 4 | නිවැරදි අංගහාර හා ශිල්පීය ප්‍රාගුණ්‍යය | 20 | 15 |
| 5 | ප්‍රාසංගික බව | 15 | 15 |
| 6 | සාමූහික බව (නර්තනය සඳහා සහභාගි වන සමස්ත ශිල්පීන්ගේ දායකත්වය) | 15 | 15 |
| 7 | උචිත රංග වස්ත්‍රාභරණ | - | 05 |
| | **එකතුව** | **100** | **100** |

**03. ශාස්ත්‍රීය නර්තන - ඒකල**

| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | සාම්ප්‍රදායික බව සුරැකීම | 20 | 20 |
| 2 | ගායන,වාදන හා නර්තන සුසංයෝගී බව | 20 | 20 |
| 3 | අවකාශ භාවිතය | 15 | 15 |
| 4 | ශිල්පීය ප්‍රාගුණ්‍යය | 25 | 20 |
| 5 | ප්‍රාසංගික බව හා නිමාව | 20 | 20 |
| 6 | උචිත රංග වස්ත්‍රාභරණ | - | 05 |
| | **එකතුව** | **100** | **100** |

**04.වාදන - පිරිමි - ඒකල - දක්ෂතම වාදන ශිල්පියා**


| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | වාදනය සඳහා වාද්‍ය භාණ්ඩ කිහිපයක් භාවිතය | 20 | 20 |
| 2 | අක්ෂර වාදනයේ හැකියාව, සුපැහැදිලි බව | 25 | 25 |
| 3 | පද සංයෝජනය | 20 | 20 |
| 4 | වාදන ශිල්පීය දක්ෂතා | 15 | 10 |
| 5 | හඬ පාලනය | 10 | 10 |
| 6 | ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීම | 10 | 10 |
| 7 | උචිත රංග වස්ත්‍රාභරණ | - | 05 |
| | **එකතුව** | **100** | **100** |

**05.වාදන - ගැහැණු - ඒකල - ගායනය සමඟ වාදනය**

| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | වාදන ශිල්පීය දක්ෂතාව | 20 | 20 |
| 2 | හඬ පාලනය | 25 | 25 |
| 3 | වාදනයේ හා ගායනයේ සුසංයෝගී බව | 20 | 20 |
| 4 | තාල අවබෝධය | 15 | 10 |
| 5 | වාද්‍ය භාණ්ඩ කීපයක් වාදනය කිරීමේ හැකියාව | 10 | 10 |
| 6 | ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීම | 10 | 10 |
| 7 | උචිත රංග වස්ත්‍රාභරණ | - | 05 |
| | **එකතුව** | **100** | **100** |

**06. ජ්‍යෙෂ්ඨ පුරවැසි - සමූහ - මිශ්‍ර**

| අනු අංකය | නිර්ණායකය | පළාත් | ජාතික |
|---|---|---|---|
| 1 | උචිත නාට්‍යමය පෙළපාලිය තෝරා ගැනීම | 05 | 05 |
| 2 | සමස්ත අංගයේ නිමැවුමට සහභාගි වන ශිල්පීන්ගේ සාමූහික දායකත්වය | 15 | 15 |
| 3 | සංවාද, ගායනාවල පැහැදිලි බව | 15 | 15 |
| 4 | අනුකරණය, සමාරෝපය, චරිත නිරූපණය ආදී නාට්‍යමය ප්‍රයෝග ප්‍රදර්ශනය කිරීම | 25 | 25 |
| 5 | රංග භූමිය භාවිතය | 20 | 20 |
| 6 | රංග භාණ්ඩ භාවිතය | 05 | 05 |
| 7 | ප්‍රාසංගික බව | 15 | 15 |
| | **එකතුව** | **100** | **100** |



**තිලක් නන්දන හෙට්ටිආරච්චි**
**අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)**

**අත් කළේ/ එච්. එම්.බී.පී . හේරත්**
**ලේකම්**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**ආදර්ශ අයදුම් පත්‍රය (පළාත්/ජාතික)**
**සිංහල/ දෙමළ/ මුස්ලිම්**

මෙම ආදර්ශයට අනුව අයදුම්පත පිළියෙල කිරීමේදී යතුරු ලියනය හෝ පරිගණකය භාවිතා කරන්නේ නම් ඉතා වැදගත් වේ.

**ප්‍රතිභා 2024**
**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන තරඟාවලිය**

01. සංස්කෘතික මධ්‍යස්ථානයේ නම ------------------------------------------------------------------------
02. සංස්කෘතික මධ්‍යස්ථානයේ ලිපිනය ------------------------------------------------------------------------
03. දුරකථන අංකය ------------------------------------------------------------------------
04. සංස්කෘතික මධ්‍යස්ථානය අයත් වන
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ------------------------------------------------------------------------
දිස්ත්‍රික්කය ------------------------------------------------------------------------
පළාත ------------------------------------------------------------------------

05. ඉදිරිපත් වන තරඟ ශීර්ෂය හා නම් (චක්‍රලේඛය අනුව සටහන් කරන්න)
තරඟ ශීර්ෂ අංකය තරඟ ශීර්ෂය
උදා. (A) - 01 වැස්ස හා ළමා ලෝකය

1. -------------------- ------------------------------------------------------------------------
2. -------------------- ------------------------------------------------------------------------

06. තරඟයට සහභාගී වන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය
(මුලකරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)

| ලියාපදිංචි අංකය | නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | උපන් දිනය | 2024.06.30 දිනට වයස | අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

07. අතිරේක අයදුම්කරුවන්ගේ නම් (ගායන වාදන හැර)
------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------
08. කණ්ඩායම භාරව පැමිණෙන ගුරු භවතුන්ගේ නම්
------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------
09. තරඟය සඳහා වාදනයෙන් හා ගායනයෙන් සහභාගී වන අයගේ නම් වෙන වෙනම සටහන් කරන්න.
1. ------------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------------

10. ප්‍රසංග අංගය පුහුණු කළ ගුරු මහතා/මහත්මිය ගේ නම් වෙන වෙනම සටහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

මෙම තරඟයට සහභාගී වන සියලුම අයදුම්කරුවන් තරඟ ඉසව් වලට අදාළ වයස් සීමාවෙන් තෝරා ගත් බව සහතික කරමි. මෙම චක්‍රලේඛයේ සියලුම කොන්දේසි වලට අනුකූලව තරඟ කිරීමට බැඳී සිටින බවත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවත්, සෑම තරඟ අවස්ථාවකදීම මාගේ සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසුන්/සිසුවියන් විනයානුකූලව හැසිරවීමේ වගකීම පෞද්ගලිකව භාර ගන්නා බවත් සහතික කරමි.

10. ගුරු භවතුන්ගේ නම් — අත්සන

---------------------------------------------------------------------- ---------------------------

---------------------------------------------------------------------- ---------------------------

11. ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරියාගේ නම — අත්සන

---------------------------------------------------------------------- ---------------------------

නිල මුද්‍රාව

දිනය : --------------------